PR/2018/27S

ජපන් ජනතාවගෙනි
ஜப்பானிய மக்களிடமிருந்து
From the People of Japan


**ජපන් තානාපති කාර්යාලය**

නො. 20, ශ්‍රීමත් ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව

දුරකථනය (+94-11-2693831~3, ෆැක්ස් (+94-11-2698629)

ඊමේල්: cultujpn@co.mofa.go.jp


**පුවත්පත් නිවේදනය**

2018 සැප්තැම්බර් මස 11 වන දින

# ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂික මෙහෙයුමට ජපානයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 1.25 ක්

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ක්‍රියාත්මක වන බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂික මෙහෙයුම සඳහා, ජපන් රජය, ඇමරිකානු ඩොලර් 1,249,997 ක (දළ වශයෙන් රුපියල් මිලියන 194 ක) ආධාර මුදලක්, මයින්ස් ඇඩ්වයිසරි ග්‍රෑප් හෙවත් මැග් (Mines Advisory Group - MAG) සංවිධානයට සහ ශාප් (SHARP – SKAVITA Humanitarian Assistance and Relief Project ) සංවිධානයට ලබා දීමට තීරණය කර ඇත. මෙම ආධාර ගිවිසුමට කොළඹ පිහිටි ජපන් තානාපති කාර්යාලයේදී 2018 සැප්තැම්බර් මස 11 වන දින ජපන් තානාපති ගරු කෙන්ඉචි සුගනුමා මැතිතුමා සහ මැග් (MAG) සංවිධානයේ තාක්ෂණික මෙහෙයුම් කළමණාකාර රොවිනන් ෆර්නැන්ඩස් මහතා ද ශාප් (SHARP) සංවිධානයේ වැඩසටහන් කළමණාකාර ලුතිනන් කර්නල් (විශ්‍රාමික) වී. එස්. එම්. ජයවර්ධන මහතා ද අත්සන් තැබීය.

මෙම ව්‍යාපෘතිය මගින් මයින්ස් ඇඩ්වයිසරි ග්‍රෑප් හෙවත් මැග් (Mines Advisory Group - MAG) සංවිධානයට ඇමරිකානු ඩොලර් **මිලියන** 624,997 සහ ශාප් (SHARP – SKAVITA Humanitarian Assistance and Relief Project) සංවිධානයට ඇමරිකානු ඩොලර් **මිලියන** 625,000 ක ආධාර මුදලක් ලබා දීමට තීරණය කර ඇත. අවතැන් වූ උතුරේ ජනතාවට නැවත පදිංචි වී තම ජීවිකාවන් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා රජය මගින් ක්‍රියාත්මක වන බිම්බෝම්බ වලින් තොර ආරක්ෂිත ප්‍රදේශ ඇති කිරීමේ වැඩපිළිවෙල මෙමගින් තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇත.

ශ්‍රී ලංකාවේ අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමටත් ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු නැවත ආරම්භ කිරීමටත් එමෙන්ම වෙනත් ජීවනෝපායන් ආරම්භ කිරීම සඳහාත් මූලික අවශ්‍යතාවයක් වන බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලියට ජපානය විශාල ලෙස මූල්‍යමය ආධාර ලබා දී ඇත. වර්ෂ 2003 සිට උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි බිම්බෝම්බ ඉවත් කිරීමේ කාර්යයන් සඳහා ජපානය තම ආධාර සැපයීමේ වැඩ සටහන යටතේ ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 33 ක් ලබා දී ඇත. වර්ෂ 2020 වන විට ශ්‍රී ලංකාව බිම්බෝම්බ බලපෑමෙන් නිදහස් කිරීමේ අරමුණ කරා ළඟා වීමට ජපානය ඉමහත් දායකත්වයක් ලබා දී ඇත.

මේ සම්බන්ධව අදහස් දැක්වූ ශාප් (SHARP) සංවිධානයේ වැඩසටහන් කළමණාකාර ලුතිනන් කර්නල් (විශ්‍රාමික) වී. එස්. එම්. ජයවර්ධන මහතා "2014 ස්ථාපිත කළ ශාප් (SHARP- සංවිධානය ශ්‍රී ලංකාවේ බිම්බෝම්බ ඉවත් කිරීමේ දෙවන දේශීය සංවිධානය බවට පත්වුනා. මෙම බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලියට තුන්වන වරටත් ජපාන රජයෙන් ලැබුණු සහාය අතිමහත් වන අතර ශාප් සංවිධානය උපරිම ශක්ති ප්‍රමාණයෙන් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස අපගේ සේවාවන් දිගටමපවත්වාගෙන යාමට බලාපොරුත්තු වනවා" යැයි පැවසීය.

මෙම ආධාර මුදල පිළිබඳව අදහස් දක්වමින් රොවිනන් ෆර්නැන්ඩස් මහතා ප්‍රකාශ කර සිටියේ "ශ්‍රී ලංකාවේ හා ලොව පුරා බිම්බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන් සඳහා ආධාර කිරීම සම්බන්ධයෙන් අභිමානයට පාත්‍ර වූ ජපාන් රජයෙන් ලබාදෙන මෙම ආධර මුදල අප ඉතා ගෞරවයෙන් පිළිගන්නා අතර පසුගිය තෙවසර තුල පමණක් මැග් ශ්‍රී ලංකා සංවිධානයත් ජපාන රජයත් අතර හවුල්කාරිත්වය හරහා බිම්බෝම්බ 11,000කට අධික ප්‍රමාණයක් ඉවත් කර විනාශ කිරීමට හැකි වී තිබෙනවා. මෙමගින් මන්නාරම සහ මුලතිවු දිස්ත්‍රික්කයේ නැවත පදිංචි වීම සඳහා දහස් ගණනින් පැමිණෙන පුද්ගලයන්ගේ ජීවිත හා ජීවිකාවන් ගොඩනැංවීමට හැකි වී තිබෙනවා. ජපාන රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වීමට නියමිත මෙම නව ව්‍යාපාතිය හරහා වවුනියා දිස්ත්‍රික්කයේද බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට මැග් ශ්‍රී ලංකා සංවිධානය බලාපොරොත්තු වනවා. ජපන් ජනතාවගේ ආධාර හමුවේ තවදුරටත් ජීවිත සුරැකෙන අතර එයට අමතරව ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් බිම්බෝම්බ අවදානමට ලක්ව ඇති ඉතා දිළිඳු ප්‍රජාවන් සඳහා ජීවනෝපායයන් සංවර්ධනයට සහාය වීමෙන් අනාගතය ගොඩනැගීමක් ද සිදුවනවා . වර්ෂ 2020 වන විට ශ්‍රී ලංකාව බිම්බෝම්බ බලපෑමෙන් නිදහස් කිරීමේ අරමුණ කරා ලගා වීමට මැග් ශ්‍රී ලංකා සංවිධානය බලාපොරොත්තු වනවා" යන්නයි.


වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න

ජපන් තානාපති කාර්යාලයේ සංවර්ධන සහයෝගිතා අංශය

දුරකථන අංක 011-2693831 දිගුව 225

ඊමේල් : cultujpn@co.mofa.go.jp